නිවාස-පාදක විවෘත-ග්‍රන්ථ පරීක්ෂණ සම්බන්ධ ව සිදු කළ යුතු ප්‍රකාශන පත්‍රය (Declaration Form for Take-Home Open-Book Examinations) මේ සමග අමුණා ඇත. එය බාගත කරගන්නා ලෙස සියලු ම සිසුසිසුවියන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

ඔබ අනිවාර්යයෙන් ම පහත සඳහන් දේ ඉටු කළ යුතු යි.

1. මෙම ප්‍රකාශන පත්‍රය නිසි ලෙස පුරවා අත්සන් කරන්න.
2. එහි ඡායාරූපයක් (photo) නැතහොත් පරිලෝකන පිටපතක් (scanned image) ලබා ගන්න.
3. එම ඡායාරූපය හෝ පරිලෝකන පිටපත ඔබේ ශිෂ්‍ය ලියාපදිංචි අංකය සහිත ව පහත දැක්වෙන ආකෘතියට අනුව නැවත නම් කරන්න (rename). එහි දී පෙරටු ඇලඉර (/) භාවිත නො කළ හැකි ය.

   නිදසුන් : a18315
   a18ai890

4. ඔබේ ඡායාරූපය හෝ පරිලෝකන පිටපත PDF පිටපතක් ලෙස සුරකින්න (save).
5. එසේ සුරකින ලද PDF වර්ගයේ ප්‍රකාශන පත්‍රය පහත සඳහන් විද්‍යුත්-තැපැල් ලිපිනයට **10.10.2021 දින හෝ ඊට පෙර** යවන්න.

**exams@arts.pdn.ac.lk**

(විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 01.12.2020 දිනැති අංක 11/2020 දරණ කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාර ව මෙම ප්‍රකාශනය අනිවාර්ය වේ.)

**ඩබ්ලිව්. වී. ලක්ෂ්මන් කුමාර,**
සහකාර ලේඛකාධිකාරී, ශාස්ත්‍ර පීඨය,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

**<u>නිවාස පාදක විවෘත ග්‍රන්ථ පරීක්ෂණ ප්‍රකාශනය</u>**

**<u>පළමු සමාසිකාන්ත පරීක්ෂණය - 2020/2021 අධ්‍යයන වර්ෂය</u>**

**<u>ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය</u>**

මම, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ, ශාස්ත්‍ර පීඨයේ 2020/2021 අධ්‍යයන වර්ෂයේ, පළමු සමාසිකාන්ත පරීක්ෂණයේ නිවාස පාදක විවෘත ග්‍රන්ථ පරීක්ෂණය සඳහා බාර දුන් උත්තර පත්‍ර, අන් අයගෙන්, අනු පිටපත්/කොපි කිරීමේ අදහසින් කිසි ම පුද්ගලයෙකු, පුද්ගලයින් හෝ සංවිධාන සමඟ සන්නිවේදනය නො කළ බවටත්, අන් අය සමඟ පිළිතුරු පත් හුවමාරු නො කළ බවටත්, අන් අය ලවා නොලිය වූ බවටත් / විඩම්භනය නො කළ බවටත් අවංක ව හා අව්‍යාජ ව මේ සමඟ සහතික කොට ප්‍රකාශ කරමි (විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2020.12.01 දිනැති අංක 11/2020 දරණ කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාර ව).

ශිෂ්‍යයාගේ නම - -----------------------------------------------------------

ශිෂ්‍ය ලියාපදිංචි අංකය - -----------------------------------------------------------

ශිෂ්‍යයාගේ අත්සන - -----------------------------------------------------------

දිනය - -----------------------------------------------------------